ප්‍රශ්න සහ පිළිතුරු

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2023 දෙසැම්බර්

මෙම ලේඛනයෙන් ප්‍රශ්නගත මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතට අදාළ කෙටි ප්‍රශ්න හා පිළිතුරු මාලාවක් සපයනු ලබයි. පනත් කෙටුම්පතේ මෙම අනුවාදයේ නීතිපතිවරයා විසින් සිදුකරනු ලදුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කරන ලද යෝජිත කාරක සභා අවස්ථාවල සංශෝධන අඩංගු වේ. මුලින් ගැසට් කරන ලද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත හා යෝජිත සංශෝධන අතර වෙනස්කම් පැහැදිළි කරගැනීම සඳහා මෙතැන බලන්න.

**ප්‍ර1. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත යනු කුමක්ද?**

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් 18 වන දින මහජන ආරක්ෂණ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර 2023 ඔක්තෝබර් 3 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. විශේෂිත අරමුණු සහිතව 'මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමක්' ස්ථාපිත කළ යුතු බව පනත් කෙටුම්පතේ සඳහන් වේ.




සරලව ගතහොත්, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත මගින් යම් තැනැත්තෙක් අන්තර්ජාලයේ පළ කරන, බෙදා ගන්නා දේ සඳහා වසර 20ක් දක්වා දිවෙන දඬුවම් පැනවිය හැකි වේ.

**ප්‍ර2. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසම යනු කුමක්ද?**

ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව පත් කරන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසම සමන්විත වේ. එම සාමාජිකයින් තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා හා පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද හා සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය විය යුතු වේ. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිසමට පුළුල් බලතල තිබේ. එම බලතල අතර;

- තහනම් ප්‍රකාශ සන්නිවේදනයට අදාළ පුද්ගලයන්ට, සේවා සපයන්නන්ට හා අන්තර්ජාල අතරමැදියන්ට විධාන නිකුත් කිරීම.
- තහනම් ප්‍රකාශ සන්නිවේදනය කරන පුද්ගලයන්ට එවැනි සන්නිවේදනය නතර කරීමට හා මාර්ගගත ස්ථාන අක්‍රිය කරන ලෙස අන්තර්ජාල සේවා සපයන්නන්ට උපදෙස් දෙමින් දැන්වීම් නිකුත් කිරීම.
- තහනම් ප්‍රකාශ ඉවත් කරන ලෙස අන්තර්ජාල සේවාසපයන්නන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ව්‍යවහාර සංග්‍රහ නිකුත් කිරීම (උ.දා. සේවා සපයන්නන්ට හා අන්තර්ජාල අතමැදියන්ට රීති)
- මාර්ගගත ආරක්ෂාව සම්බන්ධ සියලු කාරණාවලදී රජයට උපදෙස් සැපයීම.
- විමර්ශන පැවැත්වීමේදී පොලීසියේ සහාය ලබාගැනීම.

**ප්‍ර3. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත යටතේ දක්වා ඇති ප්‍රධාන වැරදි මොනවාද?**

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කෙටුම්පත බන්ධනාගාරගත කිරීම සහ/හෝ දඩ ඇතුළු විවිධ වැරදි සඳහා අදළ විවිධ දඬුවම් දක්වා තිබේ.

- අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මගින් ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජනයක් ඇති කරවන හෝ විවිධ පන්තිවලට අයත් තැනැත්තන් අතර " එදිරිවාදී සහ වෛරී හැඟීම් ප්‍රවර්ධනය" ප්‍රකාශ තහනම් කිරීම.
- කැරලි ගැසීමේ වරද සිදුවිය හැකි බවට වූ චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම හා අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මගින් 'ආගමික වැඳුම් පිදුම් කිරීමක හෝ ආගමික පූජාවන්ට බාධා කිරීම පවා තහනම් කිරීම.
- ආගමික හැඟීම්වලට රිදවීමේ චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම අපරාධමය වරදක් බවට පත් කිරීම.
- සන්නද්ධ හමුදාවල හෝ හමුදාවේ යම් නිලධරයකු කැරලි ගැස්වීමේ චේතනාවෙන් හෝ මහජනයා අතර බියක් හෝ තැතිගැන්මක් ඇති කරවීමේ චේතනාවෙන් යම් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම තහනම් කිරීම.
- ළමා අපචාරය හා හිරිහැර කිරීම්වලට අදාළ වගන්ති අපහැදිළි වන අතර ප්‍රායෝගික තලයේදී අත්තනෝමතික ලෙස එම වගන්ති යොදාගැනීමට හැකි ය. මේ තත්වය අපයෝජන ස්වභාවයෙන් යුතු, පළිගැනීමේ කාමුක දර්ශන හා ළමා අපචාර සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී පනත් කෙටුම්පතේ සාර්ථකත්වයට සැළකිය යුතු බලපෑමක් සිදු කරනු ඇත.

**ප්‍ර4. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත උල්ලංඝනය කිරීමේදී පනත බලාත්මක කිරීමේ පටිපාටිය කුමක්ද?**

යෝජිත පනත් කෙටුම්පතේ දක්වා ඇති කාර්යපටිපටිය පහතින් දක්වා තිබේ.

1. තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කර ඇති බවට ප්‍රමාණවත් සාධක ඇති බව තීරණය කිරීමෙන් පසු කොමිසමට එහි නිළධාරීන් මගින් විමර්ශන සිදුකළ හැක.
2. තහනම් ප්‍රකාශයක් කර තිබේද යන්න තීරණය කරනු ලැබීම.
3. එම ප්‍රකාශය සංසරණය වීම වැළැක්වීම සඳහා කොමිසම විසින් එම ප්‍රකාශය කළ පුද්ගලයාට දැන්වීමක් නිකුත් කිරීම.
4. අදාළ පුද්ගලයා එම දැන්වීමට අවනත නොවේ නම්, පැය 24ක් තුළ අදාළ තහනම් ප්‍රකාශය මාර්ගගත ක්‍රමවලින් ඉවත් කරගන්නා ලෙස කොමිෂන් සභාව අන්තර්ජාල සේවා සපයන්නාට දැන්වීමක් නිකුත් කිරීම.
5. වැරදිකරු/ අන්තර්ජාල සේවා සපයන්නා එම දැන්වීම් නියෝගවලට අනුකූල නොවන්නේ නම් 'තහනම් ප්‍රකාශ' සංසරණය වීම වැළක්වීමට නියෝගයක් ඉල්ලා කොමිසමට මහේස්ත්‍රාත් අධිකරණයට ඉල්ලීමක් කළ හැකි වේ.
6. මහේස්ත්‍රාත්වරයෙකුගේ නියෝගයක් පිළිපැදීමට අපොහොසත්වීම වරදක් වන අතර බන්ධනාගාරගත කිරීම සහ/හෝ දඩ සමඟ දඬුවම් නියම කළ හැක.
7. පනත් කෙටුම්පතේ විධිවිධාන යටතේ එම පුද්ගලයා වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ වරදකරු බව ඔප්පු වූ පසු, ඔහු සිර දඬුවමකට සහ/හෝ විශාල දඩයකට යටත් වනු ඇත.

**ප්‍ර5. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ ලැයිස්තුගත කර ඇති අන්තර්ජාලය සහ අපරාධ නියාමනය කිරීම සඳහා දැනටමත් ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කර තිබේද?**

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත තුළ සපයා ඇති වැරදි නියාමනය කරන නීති කිහිපයක් දැනටමත් තිබේ:

| නීතිය | ප්‍රතිපාදනය | අදහස් |
|---|---|---|
| දණ්ඩ නීති සංග්‍රහය<br>(1883 අංක 2 දරන ආඥාපනත) | 150, 291, 291 (අ), 291 (ආ), 484 හා 485 වගන්ති | දණ්ඩ නීති සංග්‍රහයේ මෙම වගන්ති මගින් හිතාමතා කෝලාහලයක් ඇති කිරීම (150), ආගමික රැස්වීමකට බාධා කිරීම (291), තුවාලකිරීම (291 ඒ) සහ ආගමික හැඟීම් ඇවිස්සීම (291ඊ), සාමය කඩ කිරීමේ අදහසින් හිතාමතා අපහාස කිරීම (484) කැරැල්ලක් ඇති කිරීමට අසත්‍ය වාර්තා බෙදා හැරීම (485).<br><br>පනත් කෙටුම්පත මෙම විධිවිධාන නැවත වතාවක් දක්වා ඇති අතර පනවා ඇති දඬුවම් තවදුරටත් උග්‍ර කර තිබේ. |

| | | |
|---|---|---|
| සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනත (2007 අංක 56 දරන පනත) | 3 වගන්තිය | ශ්‍රී ලංකාව, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනතේ 3 වැනි වගන්තිය යටතේ, වෙනස්කම් කිරීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වය අවුස්සන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය ප්‍රචාරය කිරීම දැනටමත් සීමා කර ඇත. පනත් කෙටුම්පතේ අපැහැදිලි අරුත් දෙන 3 වැනි වගන්තිය මගින් "විවිධ ජනප්‍රජාවන් අතර අමනාපය සහ සතුරුකම" ඇති කළ හැකි අසත්‍ය ප්‍රකාශ තහනම් කිරීමෙන් අත්තනෝමතික භාවිතයට තුඩු දිය හැකි වේ. |
| පරිඝනක අපරාධ පනත (2007 අංක 24 දරන පනත) | 6 හා 17 වගන්ති | පරිගණක අපරාධ පනතේ 6 වැනි වගන්තිය ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය හෝ මහජන සාමය අනතුරේ හෙළීම සඳහා පරිගණකයක් යොදාගැනීම අපරාධයක් බව දක්වයි.<br>ජාතික ආරක්ෂාවට හෝ මහජන සාමයට තර්ජනයක් වන අසත්‍ය ප්‍රකාශවල මාර්ගගත සන්නිවේදනයන් අපරාධයක් බවට පත් කිරීමට ද පනත් කෙටුම්පත උත්සාහ කරයි.<br><br>පොලිස් පරිගණක අපරාධ විමර්ශන සඳහා සහාය වීම සඳහා අමාත්‍යවරයා විසින් විශේෂඥයින් (රාජ්‍ය නිලධාරීන්) පත් කිරීම සඳහා පරිසනක අපරාධ පනතේ 17 වන වගන්තිය මඟින් විධිවිධාන සලසා ඇත. මෙය විශේෂඥයන් පත්කිරීමේදී මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ දක්වා ඇති ක්‍රියා පටිපාටියට සමානය. |

| | | |
|---|---|---|
| | | |
| අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත (1927 අංක 04 දරන ආඥාපනත) | 2 වගන්තිය | අසභ්‍ය ප්‍රකාශන ආඥාපනතේ 2 වැනි වගන්තියට අනුව අසභ්‍ය ලේඛන, චිත්‍ර, මුද්‍රණ, චිත්‍ර, මුද්‍රිත ද්‍රව්‍ය, පින්තූර ආදිය නිෂ්පාදනය කර බෙදා හැරීම වරදක් බව සඳහන් වේ. අමනාපය, සතුරුකම යනාදිය ඇති කරන 'තහනම් ප්‍රකාශ' සන්නිවේදනය වැළැක්වීමෙන් එවැනි තහනමක් පනත් කෙටුම්පතේ නැවත දක්වා තිබේ. |
| ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත (2006 අංක 19 දරන පනත) | 2 වගන්තිය | ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 වැනි වගන්තිය දත්ත පණිවිඩ, විද්‍යුත් ලේඛන, විද්‍යුත් වාර්තා හෝ වෙනත් සන්නිවේදනවල සත්‍යතාව, අඛණ්ඩතාව සහ විශ්වසනීයත්වය පිළිබඳ මහජන විශ්වාසය ප්‍රවර්ධනය කිරීම එහි එක් අරමුණක් ලෙස දක්වා ඇත. අන්තර්ජාලය හරහා කරන ලද ප්‍රකාශවල සත්‍යතාව නියාමනය කිරීමට දරන උත්සාහයේදී පනත් කෙටුම්පත මෙම පනතට සමාන වේ. |

කෙසේවුවද, පෞද්ගලික තොරතුරු නිරාවරණය මගින් ඇතිවන ගැටළු හා මාර්ගගත ක්‍රමවලින් සිදුවන ළමා අපයෝජනය සඳහා රීතීන් ලංකාව තුළ ක්‍රියාත්මක නොවේ. එහෙත් මෙම මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත තුළ මෙම ගැටළු ප්‍රමාණවත් ලෙස සාකච්ඡා වී නොමැත.

**ප්‍ර6. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත මගින් පුරවැසියාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝන වී ඇති බව ප්‍රකාශ කරන්නේ ඇයි?**

පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්වීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වගන්තිය යටතේ නීතියක් සමාලෝචනය කිරීමට සීමිත අවස්ථාවන් යටතේ පූර්ව අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ලබා දී තිබේ. වැදගත් කරුණක් නම්, පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක්කිරීමට පෙත්සම් 45ක් 2023 ඔක්තෝබර් 3 හා 17 කාලය අතරතුර ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබීමයි. ඔක්තෝබර් 18 සහ 19 යන දෙදින තුළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නඩු විභාගය අවසන් විය. එහිදී පෙත්සම්කරුවන් අවධාරණය කළේ;

- පනත් කෙටුම්පතේ වගන්තිවල අන්තර්ගත වී ඇති බල අපයෝජනයන් පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සහ
- පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි අධිකරණය විසින් මුලින් තක්සේරු කළ යුතු අතර ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සමඟ කිසියම් නොගැලපීමක් හඳුනා ගැනීමෙන් පසුව, නීතිපතිවරයා විසින් යෝජනා කළ හෝ වෙනත් ආකාරයකින් යෝජිත සංශෝධන ඇගයීමට ලක් කළ යුතු බවයි.

<u>විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවයට අභියෝග කළේ එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නොගැලපෙන බවත් නීතියක් බවට පත් කළ නොහැකි බවත් ය යන පදනමේ සිටය.</u>

- මෙම පනත් කෙටුම්පත අසාධාරණ, අත්තනෝමතික හෝ තාවකාලික ආකාරයෙන් බලාත්මක කළ හැකි පුළුල් හා නොපැහැදිළි වැරදි නිර්මාණය කර ඇත.
- පනත් කෙටුම්පත මගින් නොපැහැදිලි ලෙස අර්ථ දක්වා ඇති අත්තනෝමතික හේතූන් මත කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කළ හැකි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් සෘජුවම පත් කරන ලද කොමිෂන් සභාවට පුළුල් බලතල ලබා දී ඇත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) ව්‍යවස්ථා මගින් සහතික කර ඇති අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස භුක්ති විඳීම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වැනි ව්‍යවස්ථාව මෙම පනත් කෙටුම්පත මගින් නීති විරෝධී ලෙස සීමා කර තිබේ.
- අමාත්‍යවරයා විසින් "විශේෂඥයන්" ලෙස තෝරා ගනු ලබන පුද්ගලික පුරවැසියන්ට අත්තනෝමතික ලෙස සොදිසි කිරීම සහ අත්පත් කරගැනීමේ පුළුල් සහ පුළුල් බලතල මෙම පනත් කෙටුම්පත මගින් ප්‍රදානය කෙරේ.

**ප්‍ර7. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත අන්තර්ජාල අතරමැදියන්ට හා අන්තර්ජාල සේවා සපයන්නන්ට කෙසේ බලපානු ලබයිද?**

මෙම පනත් කෙටුම්පත මගින් පහත සඳහන් පරිදි අන්තර්ජාල අතරමැදියන්/අන්තර්ජාල සේවා සපයන්නන්ට ඔවුන්ගේ ස්වාධිපත්‍යය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ නෛතික වගකීම් කෙරෙහි බලපෑ හැකි පරිදි, කොමිෂන් සභාවේ නියෝගවලට අනුකූල වන ලෙස සැලකිය යුතු පීඩනයක් එල්ල කළ හැකි නීති රාමුවක් හඳුන්වා දෙයි.

| **ගැටළුව** | **පරස්පර ව්‍යවස්ථාමය විධිවිධාන** | **ඇඟවුම්** |
|---|---|---|

| | | |
|---|---|---|
| බලහත්කාරීව විරුද්ධ අදහස් ප්‍රකාශනය කිරීම. (11(අ)) වගන්තිය | 14(1)(අ) සහ 10 ව්‍යවස්ථා | මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවට ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය කළ හැකි, ප්‍රතිවිරුද්ධ අදහස් පළ කරන පුද්ගලයන්ට, සේවා සපයන්නන්ට හෝ අන්තර්ජාල මැදිහත්කරුවන්ට නියෝග නිකුත් කළ හැකිය. නිදසුනක් වශයෙන්, බෞද්ධ මාර්ගයේ නිවැරදි බව ප්‍රවර්ධනය කරන බෞද්ධ හිමිනමකට එමගින් විකල්ප මත පළ කිරීමට බල කෙරෙනු ඇත. |
| අධිකරණ නියෝගයකින් තොරව මාර්ගගත අන්තර්ගතයන් ඉවත් කිරීම (11( (ඇ)) සහ 11(ඊ)) වගන්ති | 14(1)(අ) සහ 10 ව්‍යවස්ථා | උසාවි නියෝගයකින් තොරව මාර්ගගත අන්තර්ගතයන් ඉවත් කිරීම සඳහා නිවේදන සහ නිර්දේශ නිකුත් කිරීමට කොමිෂන් සභාවට ඇති බලය මගින් ව්‍යවස්ථාපිත අයිතීන් උල්ලංඝනය වීම, සේවා සපයන්නන් සහ අවසාන පරිශීලකයින්ට බලපෑම් ඇතිවිය හැක. |
| සේවා සපයන්නන් මත පීඩනය. 11 (ඊ), 11 (ඔ), සහ 53 (1) (ආ) වගන්ති | 14 (1) (උෟ) ව්‍යවස්ථාව | සේවා සපයන්නන් සඳහා නිර්දේශ වන, කොමිෂන් සභාවේ වෙබ් අඩවි ලියාපදිංචි අවශ්‍යතාවය සේවා සපයන්නන් අනවශ්‍ය පීඩනයක් එල්ල කළ හැකි අතර, නිදහසේ ක්‍රියාකාරකම් සිදු කිරීමේ අයිතියට බාධා විය හැකිය. |
| තොරතුරු හුමවාරුව නිරන්තර සුපරීක්ෂණයට ලක් කිරීම. 11 (උෟ) වගන්තිය | 12 හා 14 (1) (අ) ව්‍යවස්ථා | උසාවි නියෝගයකින් තොරව අන්තර්ජාල ප්‍රවේශය අක්‍රිය කිරීමට නිර්දේශ කිරීමට ඇති බලය මගින් විධිමත් නීතිමය පරීක්ෂාවකින් තොරව අන්තර්ජාල තොරතුරු හුවමාරුව නිරන්තර සුපරීක්ෂණයට ඉඩ සළසා තිබේ. |
| මාර්ගෝපදේශවලින් තොරව නීති සම්පාදන බලය. 11 (ඒ) වගන්තිය | 12 (1) ව්‍යවස්ථාව | පැහැදිලි මාර්ගෝපදේශ සහ නිශ්චිත නිර්ණායක නොමැතිව කොමිෂන් සභාවට නීති සම්පාදනය කිරීමට ඇති බලය සමානාත්මතාවයේ අයිතිය උල්ලංඝනය කරන අතර විනිවිදභාවය සහ නීතිය යටතේ සමාන ආරක්ෂාව පිළිබඳ සැක |

| | | |
|---|---|---|
| | | සංකා මතු කරයි. |

**ප්‍ර8. යෝජනා කර ඇති කාරක සභා අවස්ථාවල සංශෝධන සහිත මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත නීතියක් බවට පත් කළ හැකිද?**

ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2023 නොවැම්බර් 7 දින පනත සම්බන්ධයෙන් සිය මතය පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකවරයාට දැනුම් දෙන ලදී. කාරක සභා අවස්ථා සංශෝධන 31ක් පාර්ලිමේන්තුවේ සරල බහුතර ඡන්දයෙන් සම්මත කළ හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේය.

යම් සිදුවීමක් සම්බන්ධ අසත්‍ය ප්‍රකාශ, අධිකරණයට අපහාස කිරීම, කැරැලි කෝලාහල ඇතිකිරීම, ආගමික රැස්වීම්වලට බාධා කිරීම, හා ආගමික හැඟීම්වලට බාධා කිරීමේ අරමුණින් සිදුකරන ප්‍රකාශ සම්බන්ධ වගන්ති සඳහා සංශෝධන නියම කරන ලදී.

මෙම සංශෝධන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත හෝ එහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන බව අධිකරණය නිගමනය කළේය.

**ප්‍ර9. ශ්‍රී ලංකාවේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත වෙනත් රටවල මාර්ගගත සුරක්ෂිතභාවය සඳහා සකස් කළ පනත් සමඟ සන්සන්දනය කළ හැකිද?**

<u>එක්සත් රාජධානිය</u>

එක්සත් රාජධානියේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත ළමා ආරක්ෂාව සහ ආරක්ෂිත සමාජ මාධ්‍ය වේදිකා කෙරෙහි අවධානය යොමු කරන පුළුල් පරාසයක නීති සපයයි.

නිශ්චිත සීමා, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සම්බන්ධතා ආරක්ෂා කිරීමට බහුවිධ ප්‍රවේශ යටතේ දක්වන දායකත්වය හේතුවෙන් එම නීතිය ප්‍රශංසාවට ලක්ව තිබේ.

<u>ජර්මනිය</u>

ජර්මනියේ සංශෝධිත අන්තර්ජාල ජාල බලාත්මක කිරීමේ පනත පරිශීලක-හිතකාමී, පුළුල් හා විනිවිදභාවයෙන් යුත් අභියාචනා යාන්ත්‍රණය හා වැඩිදියුණු කරන ලද අධීක්ෂණ බලතල කෙරෙහි අවධානය යොමු කරන ලද විධිවිධාන සමඟ වෛරී ප්‍රකාශ සහ ව්‍යාජ ප්‍රවෘත්ති වලට එරෙහිව සටන් කිරීමට සාමූහික උත්සාහයක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා පනත් කෙටුම්පත මෙන් නොව, ජර්මානු සංශෝධනයේ අරමුණ වන්නේ හානිකර සබැඳි අන්තර්ගතයන් ආමන්ත්‍රණය කිරීමේදී ප්‍රවේශ්‍යතාව, විනිවිදභාවය සහ සාධාරණ අභියාචනා ක්‍රියාවලියක් සහතික කිරීම මගින් සඵලතාවය ශක්තිමත් කිරීමයි.

<u>සිංගප්පූරුව</u>

ශ්‍රී ලංකාවේ පනත් කෙටුම්පත සිංගප්පූරුවේ ඔන්ලයින් ව්‍යාජයන් සහ උපාමාරු වලින් ආරක්ෂා කිරීමේ පනතෙන් ආභාසය ලබා තිබේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා පනත් කෙටුම්පත සිංගප්පූරු පනතෙන් සැලකිය යුතු ලෙස වෙනස් වේ.

ශ්‍රී ලංකාවේ පනත් කෙටුම්පත පුළුල් පරාසයක වැරදි ආවරණය කරයි. 'තහනම් ප්‍රකාශ' නිර්වචනය කිරීම, පැහැදිලි අභියාචනා ක්‍රියාවලියක් නොමැති වීම, සමාජ මාධ්‍ය වේදිකා ලියාපදිංචිය හඳුන්වා දීම හා දැනට පවතින නීති යළි වතාවක් පනත් කෙටුම්පතට ඇතුළත් කිරීම ආදී ගැටළු ගණනාවක් කෙරෙහි අවධානය යොමු කළ හැකි වේ.

ශ්‍රී ලංකා ඔන්ලයින් ආරක්ෂණ පනත් කෙටුම්පතේ පැහැදිලි බව, නිදහස සහ ඵලදායී නියාමනය සම්බන්ධයෙන් ප්‍රවේශමෙන් සලකා බැලීමේ අවශ්‍යතාවය ඉහතින් දක්වා ඇති නීති අධ්‍යනයේදී පෙනේ.